සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 13 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි
**General Certificate of Education (Adv. Level), Grade 13, Year End Test, July 2019**

**සිංහල - I**
**Sinhala - I**

**71 S I**

පැය 03යි
**Three hours**

විභාග අංකය : ...................................................................

**සැලකිය යුතුයි :**

- **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- පහත දැක්වෙන උද්ධෘත අතුරෙන් **හතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(01) (අ) වෙළන කලක් මෙන් ද සකසා වැළඳගෙන රන් ගුහාවෙකින් නික්මෙන සිංහයක්හු පරිද්දෙන් ගඳකිළියෙන් නික්ම වඩනා නියාව දසදිග කියා යවන මෙහෙවර කරන්නවුන් මෙන් සකල ශරීරයෙන් සවනක් රැස් විහිදුවමින් මහාකාශ්‍යප ස්ථවිර ප්‍රමුඛ භික්ෂු සංඝයාවහන්සේ පිරිවරා සැවැත් නුවරට වැඩ ගෙපිළිවෙළින් සිඟා වඩනාසේක් බතක් නිසා සිඟා වඩනා ගමනක් නොවෙතත් අදින්නපුබ්බකයන්ගේ ගෙටත් වැඩි සේක. ඒ වේලාවට මට්ටකුණ්ඩලී හිත්තිය දිසාවට මූණලා වැද හොත්තේ ය. බුදුහු තමන් වහන්සේ නොදක්නා නියාව දැන ශරීර ප්‍රදේශයකින් රස්කඳක් විහිදුවා වදාළ සේක. ඒ රස්කඳ ගොසින් බිතත වැදගත, මට්ටකුණ්ඩලීත් බුදුරැස් දැක මියන වේලෙක රුවන්සක්මන මුනි පෙත්තක් ගෙන ගොස් සිටුවාලා පෙත්ත දසාවට නමාලූ කලක් මෙන් මිදුල දසාවට නැමිලා වැදහොත් තැනැත්තෝ දෙතිසක් විතර මහාපුරුෂලක්ෂණයෙන් හා අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් හා බ්‍යාමප්‍රභාකේතුමාලායෙන් හා දසදිග පතළ සවනක් බුදුරසින් හා කප්ගිනි ගත් රුවන්මෙරක් මෙන් බබළමින් වැඩ සිට බැලූ බැලූවන් ඇස් සනහන සිතුසිතුවන් සිත් සනහන ඇසුඇසුවන් කන් සනහන අනල්ප කල්ප **කෝටිශතසහස්‍රයෙහි** පිරූ සුචරිතය එක්කොට හඹා සිටුවාලුවාක් වැනි බුදුරුව දැක 'නුවණ නැති පියාණන්ගේ සමවාය නපුරු හෙයින් බුදුන් කරා ගොස් වැඳපියන්ට වේව'යි දනක් දීපියන්ට වේවයි බණක් අසාපියන්ට වේවයි මේ සොළොස්හවුරුද්දෙන් අටහවුරුද්දක් විතරක් නොවීය.

(1) බුදුන් වහන්සේ අදින්නපුබ්බකගේ නිවසට වැඩියේ කුමන කරුණු පදනම් කරගෙන ද?

(2) බුදුන් වහන්සේ වැඩිබව මට්ටකුණ්ඩලීට දැන ගැනීමට යෙදූ උපක්‍රමය කුමක් ද?

(3) 'දෙතිසක් විතර මහාපුරුෂලක්ෂණයෙන් හා අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් හා බ්‍යාමප්‍රභාකේතුමාලායෙන්' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(4) ''**කෝටිශතසහස්‍රයෙහි**'' යන යෙදුමට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04යි.)

(ආ) එ වේලෙහි රජකුමරුන් යත් යත් උපාලි ආභරණ පොදිය අතින් අල්වාගෙන බල බලා සිටි අනගි වූ සමපතෙහි ඉතා භය ඇති ව ''ශාක්‍යයෝ නම් ඉතා ගුණනපුරුය. මේ සම්පත් හැරගෙණ රාජ්‍යයට ගොස් මා මේ පවත් කී කල'' සම්පත්ති ලෝභයෙන් රජ දරුවන් උගන්වා ගෙන යවාපුයේ මේ කපුවා ය'යි මට කිපී මරා දමාපු නම් නපුර සම්පත් තබා දිවි ගලවා ගතෝතින් යෙහෙක, මේ මට සැපතෙක් නො වෙයි. විපතට කාරණ ය. මේ වැනි රජුන් සැපත් හැර මහණ වන කල මා වැනියන්ට සැපතින් කම් නැත. මම ද ඔවුන් හා සමඟ මහණ වන කල මා වැනියන්ට සැපතින් කම් නැත. මම ද ඔවුන් හා සමඟ මහණ වෙමි'යි සිතා ආභරණ පොදිය පිටින් ගසක එල්වා ''පළමු ව දුටු කෙණකුන් තෙලෙ හැරගන්නේ ය' යි අත්ගසා රජදරුවන් ගිය පද ලකුණෙන් දිව ගොස් රජකුමරුවන් හඹා ගියහ. එ කල අවුනැ'යි රජකුමරුන් විචාළ කල තමන් ආ පවත් කියා

''මම ද මහණ වෙමි'යි කීහ. රජකුමරුවෝ තොප ආ සේ ම යෙහෙක. වරෝ ය'යි කියා උනු දූ කැඳවා ගෙණ ගොස් එ කලට බුදුන් මල්ල රජුන්ගේ අනුපිය නම් නියම්ගම අනුපිය නම් වෙනෙහි වසන තෙනට ගොසින් බුදුන් දැක වැඳ එකත්පස් ව උන්හ.

එ කල ස්වාමිදරුවෝ එවුන් ආ කාරණ විචාරා මහණ වන්නට ආ බවු අසා මහණවයි. අවසර දුන් සේක. එවේලෙහි රජදරුවෝ සදෙන කියන්නාහු ''ස්වාමිනී අපගේ කුලෙහි ශාක්‍යයෝ නම් ඉතා මා නීයහ. මානයෙක් ම වඩනා ලදහ. නුඹවහන්සේ වැනියන් පවා නො වඳුම්හ යි මන් කළ කුලයෙක උපනුම්හ. අප ද මහණ වූ කළ ඒ බඳු වූ මානයෙන් උපනි නම් එ කල මහණදම් මුදුන් පැමිණිය නොහෙයි. මේ අපගේ උපාලි නම් කපුවාණන් පළමුව මහණකොට අප පසුව මහණකොට වදාළ මැනව. එසේ කල ඔවුන් අප වඳුම්හ. පුදම්හ. සත්කාර කරම්හ. එසේ කළ අපගේ අභිමාන ත් සිඳෙයි. මහණදමුත් මුදුන් පැමිණෙයි. ඉදින් මතු රාජ්‍යශ්‍රීයෙන් ලෝභයකු දූ වී නම් ''තොපගේ කපුවානන් වැද පුදා නීචක්‍රියා කොට නැවත රාජ්‍යය කරන්නට අවු දෑ'යි ශාක්‍යයන් අපට **පරිභව බෙණෙති** යි කියා දෙවනු ව රාජ්‍ය ලෝභය ද දුරු වෙයි. මේ මේ කාරණයෙන් උන් පළමුව මහණ කරවා අප පසු ව මහණ කළ මැනැවැ'යි කීහ. ස්වාමිදරුවෝ ''තොප කීයේ කාරණ ම ය. ඥානවන්තයන් සිතුව මනා සිතිවිල්ලෙක් ම ය''යි වදාරා උපාලින් පළමු ව මහණ කොට, රජ සදෙනා දෙවනු ව මහණ කොට උපසම්පදා කරවා කර්මස්ථානයන් ඉගැන්වූ සේක.

(1) ආභරණ පොදිය පිළිබඳ ව උපාලි දුටුවේ කුමන ආකාරයකින් ද?
(2) රජදරුවන්ගේ මානය බිඳීමට යෙදූ උපක්‍රමය කුමක් ද?
(3) ''ස්වාමිනී අපගේ කුලෙහි ශාක්‍යයෝ නම් ඉතා මා නීයහ'' උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(4) ''**පරිභව බෙණෙති**'' යෙදුමට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04යි.)

(ඇ) මහත් වූ සෝකයෙන් හඬා මහාබෝසතාණන්ගේ ලෙහි අත්බා මළාවූ දෝහෝයි බලා මඳක් පමණ සැලි සැලී තිබුවා දැක මහිමි තව ජීවතැයි දන දේවතාවන්ට උජ්ඣායනා කොට යන පන ඇර දෙවාලම් සිතා කිමෙක්දෝ හෝ මෙලෝ රක්නාවූ ලෝකපාල දෙවියෝ නැත්ම දෝ හෝයි අනික් සක්වල දෙවියෝ වෙසෙත් දෝහෝ නොහොත් මළාහු දෝ හෝයි හඬා දුකින් නොබලා හරිද්දයි දෙවියන්ට උජ්ඣායනා කොට හැඬූ හ.

එකල්හි උතුම් ගුණ ඇති පතිවත්වූ ඇගේ සෝකාග්නි වේගය සුවාසුදහසක් යොදුන් උඩ නැඟී සක්දෙව් රජහුගේ භවනය හුණු කෙළේ ය. ශක්‍රදේවේන්‍ද්‍රයෝ දහසක් නුවණැසින් ලොව බලනුවෝ මේ කාරණය දැක බමුණුවෙසක් ගෙන ඇසිල්ලකින් අවුත් මහ බෝසතාණන් ඇඟ ඉසළුහ. එකෙණෙහි විෂ නැසී වනය සුවව කොතන විදිබවත් නොදත හැකිවිය. මහා බෝසත් එවිට අනුන්ට වෙහෙසෙන්නට මළ වෙස්ලා වැදහොත් එකෙකු පරිද්දෙන් වහා සුවපත් වූයේ ය. චන්ද්‍රිකාව ද එසඳ සුවපත් ව සිටි ප්‍රිය ස්වාමි දැක බලවත්වූ සොම්නසට පැමිණ ස්වාමිනී. යම්බඳු නුඹ වහන්සේ මාගේ ප්‍රියකල්වූ ඇඟ අමාපැන් ඉස තිඳුක් කොට මාගේ ඒ කළකම් දුරුකොට ප්‍රිය වූ අප දෙදෙනා සමග කළ සේක් ද එසේ නුඹ වහන්සේගේ ශ්‍රී පාදය වඳිමි වැඳහොත්තීය. ඒ ශක්‍රදේවේන්‍ද්‍රයෝ ද උන් දැක බලවත් වූ සොම්නසට පැමිණ මෙතැන්හි නොවසව. පර්වතයෙන් බැස මිනිසුන්ට විසය තැන වෙසෙත්ව යි අවවාද කොට තමන්ගේ දිව්‍ය ලෝකයට ගියාහ.

(1) සක්දෙව් රජුගේ භවනය හුණු වූයේ ඇයි?
(2) කිඳුරා සුව වූ ආකාරය පැහැදිලි කරන්න.
(3) ''සක්වල දෙවියෝ වෙසෙත් දෝහෝ නොහොත් මළාහු දෝ හෝයි හඬා දුකින් නොබලා හරිද්දයි දෙවියන්ට උජ්ඣායනා කොට හැඬූ හ.'' යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(4) ''**සුවාසුදහසක්**'' යන යෙදුමට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04යි.)

(ඈ) එක්ලහි ඒ චණ්ඩාල බ්‍රාහ්මණයා එබස් අසා තමා වසන ගෙට ගොස් ස්වර්ණතිලකාව කැඳවා ඇට රජ්ජුරුවන් කී පරිද්දෙන් ම උද්දාල බ්‍රාහ්මණයාගේ ස්වරූප නොවළහා ම කීය. එතෙපුල් අසා ස්වර්ණතිලකා තොමෝ මම ඉදින් සැබවින් ම ගැහැණියක් වී නම් ඒ උද්දාල බ්‍රාහ්මණයා හා වාසය කෙරෙම් මයඃ ඊට කිසි සැකයක් නොසිතා ඉතා ප්‍රපඤ්ච නොකොට කල් නොයවා උදාසන්හි ම නික්මුණ මැනව; සෙට දවස් ම යෙමි''යි කිව.

එකල්හි ස්වර්ණතිලකාවගේ පියා ද යහපතැයි ගිවිස විසිතුරු වූ කර්මාන්ත ඇති දහසක් වටිනා පලසකින් දුවගේ ශරීරය වසා පොරවා තමා ගායනා කරන වීණාදි වූ තූර්යභාණ්ඩ ගෙන්වා ගෙන ස්වර්ණතිලකාවන් හා සමාන මඟ බැස නික්මිණි. මෙසේ නික්මුණාවූ ඒ චණ්ඩාල බ්‍රාහ්මණතෙම අතරමඟ එක් නුවරෙක රජ්ජුරු කෙනෙකුන් දක වීණා ගායනා කරනුයේ ස්වර්ණතිලකාව තමා පිටිපස හිඳිනා සේ සලස්වා තෙමේ වීණා ගායනා කරන්ට පටන් ගත. එකල්හි ඔහු පිටිපස හුන්නාවූ ස්වර්ණතිලකා තොමෝ නුවන් කෙළවරින් දෘෂ්ටිය හෙළා ස්වකීය වූ ස්ත්‍රී ලීලාවෙන් යුක්ත ව මදලස බැල්මෙකින් රජහු මුහුණ බලා තමා පෙරව හුන් පලස මඳක් පහකොට ශරීරප්‍රභා දක්වාලුව. රජ්ජුරුවෝ ඇගේ ශරීරාලෝක හා රූපසම්පත්තිය දක කාමයෙන් විසංඥ ව සිහි මුළා ව මඳ ඇසිල්ලකින් ලබන ලද ආස්වාද ඇති ව ''මෝ තොම සස්වාමික ද අස්වාමික ද'' විචාර ''අස්වාමිකය එතෙකුදු වුවත් සැඩොල් දුවක'' යනු අසා අනුන් බණන නිඳා බසට හයින් ස්වර්ණතිලකාව අන්තඃපුරයට ගත නොහී ''මෙබඳු වූ වර්ණසෞන්දර්යයක් හා රූපසම්පත්තියකින් යුක්ත වූ ස්ත්‍රීරත්නයක් නොලබන්නාවූ මට ජීවිතයෙන් ප්‍රයෝජන කිම් ද''යි ශෝකාතුර ව නොයෙක් ප්‍රලාප කියා හඬමින් කාමයෙන් මත් ව කටයුතු නොකටයුතු සලකා ගත නොහී කඩුව ගෙන තමන් හිස තුමූ ම කපා මළහ.

(1) මෙහි සඳහන් ස්වර්ණතිලකාවගේ අරමුණ කුමක් ද?
(2) ස්වර්ණතිලකා රජු වසඟ කරගත්තේ කෙසේ ද?
(3) ''මෝ තොම සස්වාමික ද අස්වාමික ද'' යන පාඨය ලිහිල් බසින් ලියන්න.
(4) ''**තූර්යභාණ්ඩ**'' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04යි.)

(ඉ) ස තො ස් කරණ වීණා නද ඇසුමට
නො ගො ස් සිටින පිල්බර ගණ ගොදුරට
වෙ සෙ ස් රැවින් තම මැඩුවත් බඹ හට
ස දැ ස් සවන් නොකළැයි වූ නොසතුට

වෙ සෙ සි න් යන නද දිගත පුරායා
අ ස මි න් තුරු හිස රඳන ගිරායා
උ මු වෙ න් ගත් මී අඹ මියුරායා
දූ මු වෙ න් වෙණ නදමය මියුරායා

(1) වීණා නාදයේ මිහිර වින්දෝ කවරහු ද?
(2) මහබඹු සමඟ අමනාප වූයේ කවු ද? ඒ ඇයි?
(3) 'වෙ සෙ සි න් යන නද දිගත පුරායා
අ ස මි න් තුරු හිස රඳන ගිරායා''
මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
(4) ''**උමුවෙන්**'' යන වචනයට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04යි.)

(ඊ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(1) ''මොහු නුවරින් පිටතට ගෙන ගොස් උක්කාර භූමියෙහි ලා පියව.''

(2) ''මෙබඳු ස්ත්‍රී රත්නයකින් වියෝව ජීවත් වීමට වඩා මියයාම යහපතැ යි.''

(3) ''මා දෙසූ බණ මදෙකැයි කියාත්, බොහෝවකැයි කියාත් නොකියව''

(4) ''ස්වාමි පුත්‍රයාණෙනි මා ඇරපියා නික්මුණු නියාදැයි''

(5) ''ආ! හාමුදුරුවෝත් දඩයක්කාරයෙක්. ඔබ වහන්සේ දන්නවා ඇති නොවැ හොඳට කැලේ ගැන.''

(6) ''හිඳුම පල නැත ගුරුකුලේ තව
ඇඳුරු සඳ නැත එන්නේ කිසිකල''

(7) ''තව හුඟක් වෙලා තියෙනවා මම අටට ඉස්සර වෙලා මුදලාලි මහත්තයා කඩවත ළඟ බස්සන්නම්''
(ලකුණු 4 × 3 = 12)

- **පහත දැක්වෙන කවි පෙළ පිළිබඳව රසාස්වාදයක් කරන්න.**

මිනිහා නගන කටහඬ නො ම වැකෙන කනේ
ඇත මේ කුරුලු කූඩුව උස ගහක බෙනේ
නැත උවදුරක් මෙහි මෙතුවක් පහළ වුණේ
පැටවගෙ කුඩා දෙනෙතට නිල් අහස පෙනේ

උණුසුම් ගතිය ඇතිමුත් සිය කැදැල්ලෙහි
පැටවා කැමති නැත හිර වී විසිල්ලෙහි
දෙනෙතට නිල් අහස යොමු වන ඇසිලලෙහි
ඔහු යෙදෙනවා නිදහස ගැන සෙවිල්ලෙහි

මවුපිය කුරුල්ලන් රැකවරණය ඇතිව
උන්ගේ ආලයේ වෙසෙතත් ගජමුතුව
පැටවගෙ දෙනෙත පවතී කවදත් රතුව
සැපතක් ඔහුට නැත ඉගිළෙන්නට නැතුව

දවසට සිය විටක් මවු පිය දෙදෙන විසින්
කටට ම හෙළන මුත් ආහාර කුරුලු රසින්
පිට වන තුරා ඔහු හිර වී සිටින ගසින්
ඉගිළෙන සිහින පිට මං කළ නොහැක හිසින්

අරුණලු වැටෙයි පොඩි සිදුරෙන් කුරුලු ගෙට
ගී හඬ පිටත් වෙයි රුක් ලිය මුදුන සිට
කවුළුව තුළින් එළියට හිස දමන විට
හොඳ බව පෙනෙයි මෙහි ඇතුළට වැඩිය පිට

උවදුරු එමට ඇති මුත් එළිමහන තුරේ
පැටවට පෙනෙයි එහි පවතින කුරුලු පොරේ
කොපමණ කලක් ගත වේවි ද මෙහෙම හිරේ
සිතිවිලි නිසා ඇති නිදිබර ගතිය හැරේ

සටනක් නැති ව සැපතක් ඇති විය නොහැක
මේ රැකවරණ තුළ ඇති සුවසිරි දුකෙක
උවදුරු දිගේ යන දිග මාවත මිසක
නිදහස කරා යන වෙන පාරක් කිමෙක

මවුපිය කුරුල්ලන් ආහර රැගෙන කටින්
ආවා පුරුදු ලෙස පැටියා දකින අටින්
දුටුවා හිස් ව ඇති බව ගෙය එහෙම පිටින්
පැටවා ගිහින් එළි වෙන කොට හතර වටින්

(ලකුණු 12)

(02) අවස්ථා හා සිද්ධි නිරූපණයට උචිත බස් වහරක් පරිහරණය කිරීමට ධර්මසේන හිමියන් සතු කුසලතාව විශිෂ්ටය. නිර්දිෂ්ට කතා ආශ්‍රයෙන් විමර්ශනය කරන්න.

**නැතහොත්,**

අභව්‍ය සිදුවීම් පාදක කරගනිමින් කතා රසය දනවීමටත් පාඨකයාට ජීවිතාදර්ශයක් ලබා දීමටත් ජාතක කතාකරුවා සමත් වූයේ කෙසේ දැයි නිර්දිෂ්ට ජාතක කතා ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(03) වස්තු කාමය මෙන් ම ක්ලේශකාමී අකුසල්හි ගැලීම පුද්ගලයාගේ පරිහානියට හේතු වන බව කතා රසය දනවමින් ප්‍රකාශ කිරීමට සද්ධර්මාලංකාර කතුවරයා සමත් වී ඇත්තේ කෙසේදැයි නිර්දිෂ්ට කතා ඇසුරෙන් සාකච්ඡා කරන්න.

**නැතහොත්,**

වෛද්‍ය වෘත්තියේ හා කෘෂි කර්මාන්තයේ ශ්‍රේෂ්ඨත්වය පාඨක මනස ප්‍රබෝධවත් කරමින් ඉදිරිපත් කිරීමට පූජාවලිය කතුවරයා සමත් වී ඇත්තේ කෙසේදැයි නිර්දිෂ්ට කතා වස්තු ඇසුරෙන් විමර්ශනය කරන්න.

(ලකුණු 15)

(04) (අ) වෑත්තෑවේ හිමියන්ගේ අරමුණ සාක්ෂාත් කිරීමට ගුත්තිල කාව්‍යයේ මූලාශ්‍රයේ දායකත්වය කොතෙක් දුරට සාර්ථක වූයේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 07)

(ආ) ගුත්තිල පඬිතුමගේ වීණා නාදයේ මිහිර අපූර්වාකාරයෙන් ඉදිරිපත් කිරීමට සත්ත්ව ලෝකය පාදක කරගැනීම ගුත්තිල කාව්‍යයේ සුවිශේෂත්වයට හේතුවකි. සුදුසු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(05) නූගත්කම හමුවේ අන්ධ විශ්වාස පුද්ගලයා මෙන්ම සමාජය පීඩාවට පත් කරන ආකාරය කාලෝචිතව ඉදිරිපත් කිරීමට බැද්දේගම කතුවරයා සමත් වී ඇත. සුදුසු උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

(06) දරිද්‍රතාවයෙන් පීඩාවට පත්වන සමාජ ජීවිතයේ යථාර්ථය නිරූපණය කිරීමට කෙටි කතාකරුවා සමත් වී ඇත්තේ කෙසේදැයි නියමිත කෙටිකතා තුනක් ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

(07) පුද්ගලයන් හා පරිසරය අතර ඇති සංවේදී ආධ්‍යාත්මික බැඳීම් සියුම් ලෙස විවරණය කිරීම නූතන කවියේ කැපී පෙනෙන ප්‍රවණතාවයකි. නූතන පද්‍ය සංග්‍රහයේ පද්‍ය පන්ති තුනක් ඇසුරෙන් මෙම කියමන විමසන්න. (ලකුණු 15)

(08) නාට්‍ය නිර්මාණකරුවාගේ අරමුණ ඉටුවන පරිදි මූලාශ්‍රය තෝරා ගැනීම හා චරිත නිරූපණය කිරීම පේමතෝ ජායතී සෝකෝ නාට්‍යයේ විශිෂ්ටත්වයට හේතුවකි. නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Southern Provincial Department of Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 13 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි
**General Certificate of Education (Adv. Level), Grade 12, Year End Test, July 2019**

| | | |
|---|---|---|
| **සිංහල - II**<br>**Sinhala - II** | **71 S II** | පැය 03යි<br>**Three hours** |

විභාග අංකය : ......................................................................

- **I** කොටසින් (01) ප්‍රශ්නය ද, **II** කොටසින් (2), (3) ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
- (01) ප්‍රශ්නයේ ඇති **සියලු ම** කොටස්වලට මෙම **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
- **I** කොටස **II** කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

(01) එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1 **තාලුජ අක්ෂර පමණක්** අන්තර්ගත වරණය තෝරන්න.

(1) ට, ඨ, ඩ, ඪ, ණ
(2) ච, ඡ, ජ, ඣ, ඤ
(3) ප, ඵ, බ, භ, ම
(4) ත, ථ, ද, ධ, න
(5) ක, ඛ, ග, ඝ, ඞ (......................)

1.2 **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.

(1) ආස්වාදය, කණිෂ්ඨ, මර්දනය, රිද්මයානුකූල, දර්ශනසූරී
(2) ආස්වාදය, කනිෂ්ඨ, මර්ධනය, රිද්මානුකූල, දර්ශනසශූරී
(3) ආශ්වාදය, කණිෂ්ඨ, මර්දනය, රිද්මානුකූල, දර්ශනසශූරී
(4) ආස්වාදය, කනිෂ්ඨ, මර්දනය, රිද්මානුකූල, දර්ශනසූරී
(5) ආශ්වාදය, කණිෂ්ඨ, මර්දනය, රිද්මානුකූල, දර්ශනශූරී (......................)

1.3 අකාරාදී පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) මතුගම, නෙළුව, අකුරැස්ස, හික්කඩුව
(2) ඇල්පිටිය, කොග්ගල, වැලිගම, මිරිස්ස
(3) කඹුරුපිටිය, පිටබැද්දර, පෝද්දල, හම්බන්තොට
(4) අම්බලන්ගොඩ, බූස්ස, ගිංතොට, කළුවැල්ල
(5) උක්වත්ත, බලපිටිය, රත්ගම, යක්කලමුල්ල (......................)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ඓතිහාසික යන්න වැරදිය.

(2) 'ඓ' යන්න නම්‍ය ස්වරයකි.

(3) 'ඓ' යන්න මිශ්‍ර ස්වරයක් නොවේ.

(4) 'ඓ' යන්න අර්ධ ස්වරයකි.

(5) 'ඓ' යන්න සන්ධ්‍යක්ෂරයකි. (......................)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) අග විනිසුරු, ඖෂධ උද්‍යානය, සඳ මඬල, ත්‍යාග ප්‍රදානය

(2) ආචාර්ය මඬුල්ල, ග්‍රන්ථ සැකැස්ම, ජනපති මන්දිරය, උවදුරු මැඩීම

(3) නීල නයන, නිරවද්‍ය වැකි, පහන් ආලෝකය, භාෂා නැණ

(4) මහින්ද තෙර, පිළිවෙත් ප්‍රකාශනය, මිනිස් වර්ගයා, මහා විදුහල

(5) කනිෂ්ඨ විදුහල, විද්‍යුත් එළිය, සාහිත පුස්තක, සකල ඉසුරු (......................)

1.6 තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) මිනිස්, දර්ශන, යොවුන්, ස්තූප

(2) සඳුන්, සන්ධි, විද්‍යා, පසිඳු

(3) මාර්ග, ප්‍රත්‍යය, ශිල්ප, නිර්මාණ

(4) ප්‍රශ්න, සසර, ගම්, සතුට

(5) මුහුළ, පැදි, වෙද, සඟ (......................)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ශ්‍රද්ධා, පින්කම්, අකුරු, කප් (2) ස්ථූල, කග, ස්ථිර, සුන්දර

(3) සන්ධි, සැඬ, විද්‍යා, හසර (4) පමණ, ස්වේත, අයුර, පවුර

(5) තණ, වෙසක්, පැදකුණු, ඉසුරු (......................)

1.8 කර්ම, සම්බන්ධ, අවධි හා කරණ යන විභක්තිවලට අයත් සමාස පද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) රන්කම්, අත්කම්, ළමාපොත්, හෙළදිව

(2) ගත්කරු, බුදුගුණ, මිහිදුම්, දියබත්

(3) හිරුරැස්, මුහුදුවැලි, සොරබිය, පියසමර

(4) ජනාකීර්ණ, කම්කරු, අහස්වැසි, ඇත්දළ

(5) බිඟුනද, මිණිමුතු, දූවබඩු, නිසයුරු (......................)

1.9 කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ගැයිලි, වැයිලි, දිවිලි, බැලිලි (2) කියනු, බලනු, ගයනු, රඟනු

(3) වැයුමන්, නැටුමන්, කියමන්, විදමන් (4) නටන, රඟන, අරණ, බලන

(5) දිවීම්, බැලීම්, ඉවීම්, පැනීම් (......................)

1.10 පහත සඳහන් උද්ධෘතවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියාවර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) ''රඟන ළඳුන් **බල** රූ සිරි සියල්ලා''

(ආ) ''මට රා නුදුන් තෝ ගහ මුල **වැටීයන්**''

(ඇ) ''**අසතොත්** නිවරද මුනිඳු තෙපුල්මය''

(ඈ) ''**සිතමින්** උඩඟු බව සතකුට නම කෙරෙති''

(1) විධි ක්‍රියා, ප්‍රාර්ථනා ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

(2) මිශ්‍ර ක්‍රියා, ප්‍රාර්ථනා ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා

(3) විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ප්‍රාර්ථනා ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා

(4) මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, ප්‍රාර්ථනා ක්‍රියා

(5) අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, ප්‍රාර්ථනා ක්‍රියා (......................)

1.11 තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) බලවත්, පින්වත්, ආදර්ශවත්, ගුණවත්

(2) රූමත්, සිරිමත්, දිරිමත්, මන්මත්

(3) සෙල්මුවා, දැවමුවා, රිදීමුවා, රන්මුවා

(4) පැනිති, කැඳිති, සිඟිති, කැනිති

(5) නෛපුණ්‍යය, සාකල්‍යය, ඖදාර්යය, පාණ්ඩිත්‍යය (......................)

1.12 උපසර්ගයක් යෙදී නොමැති පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) අනුගමනය, අනුකරණය, අනුරූප, අනුනායක

(2) උපනායක, උපවනය, උපභාෂා, උපලක්ෂණය

(3) පරිපූර්ණ, පරිකල්පන, පරිසමාප්ත, පරිභ්‍රමණය

(4) විමල, විශිෂ්ට, විජාතික, විරහිත

(5) අබිරහස, අබිදම්, අබිසරු, අබිමන් (......................)

1.13 නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) වැනි, එව්, සා, වනාහි

(2) අද, නැවත, යළි, වැළිඳු

(3) මෙන්, සේ, සෙව්, බඳු

(4) අනේ, විතර, පිණිස, මිස

(5) තෙක්, ඉතා, සෙද, යුහුව (......................)

1.14 ''මේ තරම් සියුමැලි ද **කළුගල්**

සිතන්නටවත් බැරි නිසා

මම ගියා අවුකන **බුදුන්ටත්**

**දැස්** දුන් මිනිසා සොයා'' යන ගීතයේ තද කළු අකුරින් මුද්‍රිත පද අයත් ව්‍යාකරණ වර්ග පිළිවෙළින් දක් වූ වරණය දක්වන්න.

(1) සමාස, විභක්ති, සන්ධි

(2) සමාස, සන්ධි, විභක්ති

(3) සන්ධි, සමාස, විභක්ති

(4) සන්ධි, විභක්ති, සමාස

(5) විභක්ති, සමාස, සන්ධි (......................)

1.15 සමාන ව්‍යාකරණ ලක්‍ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) ගියාය, නැටුවේය, කිව්වාය, ලිවුවේය
(2) නටමින්, ලියන, බලමින්, කිව්වේය.
(3) කියා, ගොස්, දකිමින්, ලියූහ
(4) කෙරිණි, බැලිණි, වැටුණි, ලියවිණි
(5) කිය කියා, ලියමින්, කළේය, බල බලා (......................)

1.16 සමාසයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) තෙල්මල්පහන්, රත්මල්, නිල්මහනෙල්, අනුකූල
(2) අනවබෝධය, උපවනය, දියබත්, කහකුරුල්ලා
(3) දුම්රිය මැදිරිය, දුශීමගීයාවක, බැතිමතුන්, මව්කිරි
(4) දරුසෙනෙහස, ගුරුඋපදෙස්, පංචේන්ද්‍රිය, මල්දම්
(5) සඳරැස්, දසපාරමිතා, කව්සිළුමිණ, අඹදඹනාරං (......................)

1.17 එකම වර්ගයට අයත් සන්ධිපද අන්තර්ගත වරණය තෝරන්න.

(1) ක්‍රිස්තුත්පත්තිය, ඔවුනොවුන්, දසත, බුත්සරණ
(2) අත්‍යවශ්‍ය, මිහින්තලය, මුංපියලි, පොත්තල්මාරිය
(3) කොස්සැට, පුනරුත්පත්තිය, දුප්පත්, අල්ල
(4) සුළඟපහර, ඇත, බුද්ධෝත්පත්තිය, ග්‍රාමෝදය
(5) සාහිත්‍යෝත්සවය, කාලෝචිත, නීලෝත්පල, මෑත (......................)

1.18 ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** පදයක් සහිත වරණය තෝරන්න.

(1) සිරිමත්, දිරිමත්, ධනවත්, බීමත්
(2) කියන, ලියන, නයන, බලන
(3) ගිරා අඹ, නොහු අඹ, ලොකු අම්මා, පුංචි අම්මා
(4) ලෞකික, භෞතික, නෛසර්ගික, භෞමික
(5) ගයන්නී, බලන්නී, කියවන්නී, බලන්නේ (......................)

1.19 ව්‍යාකරණානුකූලව නිවැරදි වැකිය තෝරන්න.

(1) තරුණයින් මේ තරම් දරුණු වන්නේ ඇයි?
(2) ගැමියෝ කරුණාවන්තයින් වෙති.
(3) පාරේ ගමන් කරන්නේ මිනිස්සු ය.
(4) ගුරුවරයෙක් වන එඩ්වඩ් මහතා දක්ෂ කවීකයෙක් ද වෙයි.
(5) තව මොහොතකින් ළමයි ගී ගයනු ඇත. (......................)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) මං ඔබට ඇත්ත කියන්නම්
(2) පයින් යන අය පාරේ දකුණෙන් යන්න ඕන.
(3) ළමයින් අදහස් දක්වතොත් ඒවා සැලකිල්ලට ගත යුතුයි.
(4) සිංහලයෝ තමයි ලොකු වැව් හැදුවේ
(5) කවුරුවත් පන්තියේ නැහැ. (......................)

(ලකුණු 20යි)

## II කොටස

- මෙම කොටසින් **(2), (3)** ප්‍රශ්න ඇතුළු ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

(02) (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එක් අවධියක භාවිත වන භාෂාව හැමදා එකසේ නොපවතින්නේ ඇයි? සීගිරි සිංහලයෙන් හෝ අදත් නොලියන්නේ කවර හෙයින් ද? මීට මූලික ම හේතුව නම්, භාෂාව භාවිත කරන ජනතාව වෙනස් වීමයි. භාෂාව වූ කලී ජනතාවක් සතු අදහස් උදහස්, ඕනෑ එපාකම්, සිතුම් පැතුම්, දුක් දොම්නස් ප්‍රකාශ කරන මාධ්‍යයයි. පරම්පරාවෙන් පරම්පරාවට මිනිසුන්ගේ අදහස් උදහස්, සිතුම් පැතුම් ආදිය වෙනස් වන විට ඊට අනුකූල වන පරිදි ඔවුන්ගේ භාෂාව ද වෙනස් වීම වැළැක්විය නොහැක්කකි. අවධියෙන් අවධියට භාෂාව වෙනස් වීමට තවත් හේතු සාධක ඇත්තේ ය. මේ හේතු සාධක සියල්ල අභ්‍යන්තර හා බාහිර වශයෙන් දෙයාකාර වේ. අභ්‍යන්තර හේතු යනු භාෂා ව්‍යවහාරයෙන්ම පැන නගින හේතුයි. බාහිර හේතු යනු භාෂාවෙන් පරිබාහිර වූ දේශපාලනික, ආර්ථික, සාමාජික ආදී සාධක නිසා පැන නගින හේතුයි. අභ්‍යන්තර හේතු යනු සුබෝච්චාරණය, සරලකරණය, ප්‍රමාද දෝෂ යනාදියයි. බාහිර හේතු යනු වෙනත් භාෂාවක බලපෑම, තාක්ෂණික අවශ්‍යතා, ජනමාධ්‍යයේ නැඟීම, වානිජ ලෝකයේ ව්‍යාප්තිය වැනි හේතුයි. කවර ම භාෂාවක හෝ පරිණාමයට හේතු විය මේ සාධක සිංහල භාෂාව කෙරේ ද අඩු වැඩි වශයෙන් බලපා ඇති බව පෙනේ.

(i) එක් අවධියක භාවිත වන භාෂාව හැමදා එකසේ නොපවතින්නේ ඇයි?
(ii) ඡේදයේ සඳහන් ආකාරයට භාෂාව හඳුන්වා ඇත්තේ කෙසේ ද?
(iii) සීගිරි හෝ පෙළොන්තරු සිංහලයෙන් හෝ අදත් නොලියන්නේ කවර හෙයින් ද?
(iv) අවධියෙන් අවධියට භාෂාව වෙනස් වීමට හේතු වන අනෙක් සාධක කීයක් තිබේ ද?
(v) අභ්‍යන්තර හේතු යනු මොනවා ද?
(vi) බාහිර හේතු යනු මොනවා ද? (ලකුණු 12යි)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියන්න. සාරාංශය කොට ලියා, සාරාංශය අග **වචන සංඛ්‍යාව** ද සඳහන් කරන්න.

උසස් කෙටිකතාවක ප්‍රධාන ලක්ෂණය වශයෙන් ගත හැක්කේ ධ්වනිත වන අභ්‍යන්තර අදහස (Theme) යි. කතාවෙන් හෙළි කෙරෙන යටි අදහස හා එයින් අර්ථාන්විත වූ අත්දැකීම පතා ම පැහැදිලි ලෙස, පාඨක සිත් තුළ රස ජනනය වන අයුරින් ඉස්මතු කොට දැක්වීම නූතන කෙටිකතාකරුවාගේ පරමාර්ථය යි. එම පරමාර්ථයට අනුගත ලෙස ලේඛකයා කතාවේ පුවත්වල යටි අදහස අනාවරණය වන සේ සකස් කරයි. එහෙත් ජාතිකකතාකරුගේ අභිප්‍රාය ප්‍රධාන වශයෙන් අත්දැකීමක් ගැඹුරින් නිරූපණය කිරීම නොවේ. ඔහුගේ අධ්‍යාශය වන්නේ කිසියම් කතා පුවතක් මාර්ගයෙන් ධර්ම ප්‍රචාරය කිරීම ය. එනිසා ඉඩ ලද හැමවිට ම කතා රසයට බාධා වන අයුරින් ජාතක කතාකරු දහම් කරුණු මතු කොට දක්වයි. මේ හේතු කොට ගෙන ජාතක කතා මුඛ්‍ය කතා පුවතට පරිබාහිර ධර්ම ව්‍යාඛ්‍යානවලින් හෙබි, රසහීන වාර්තා බවට පත් ව ඇත. මිනිසුන් අපායගාමී මාර්ගයෙන් ඉවත් කොට, නිර්වාණගාමී මඟෙහි නිරත කරවීමට තුඩු දෙන කතා පුවත් රචනා කිරීම වර්තමාන කෙටිකතාවල පරමාර්ථය නොවේ. ජීවිත විවරණය, මනුෂ්‍යත්වය හා සම්බන්ධ වූ සනාතන ධර්මතා හෙළි කිරීම, චෛතසික ස්වභාවයන් ඉස්මතු කිරීම ආදිය නූතන කෙටිකතාවේ පරමාර්ථ අතර වෙයි. ගී ද මෝපසාං, ඇන්ටන් චෙකොප් බඳු ලේඛකයන්ගේ උසස් කෙටිකතා විග්‍රහ කරන විට මේ පිළිබඳ අවබෝධයක් ලද හැකිය. චෙකොප් කෙටිකතාව හඳුන්වා දී ඇති අයුරින් එහි පරමාර්ථය වඩාත් පැහැදිලි වේ. ජීවිතයෙන් බිංදු මාත්‍රයක් නිරූපණය කිරීම කෙටිකතාකරුවාගේ මුඛ්‍ය ආධ්‍යාශය වේ. රසිකයාට සියුම් වින්දනයක් දෙමින්, ඔහුගේ ජීවිතාබෝධය පෘථුල කිරීම වර්තමාන කෙටිකතාවේ පරමාර්ථය ලෙස දැක්වීමට පුළුවන.

(ලකුණු 13)

(03) දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

(1) ජාත්‍යන්තර ත්‍රස්තවාදය හා ශ්‍රී ලංකාව
(2) බෞද්ධ සංස්කෘතිය මත පදනම් වූ ශ්‍රී ලාංකේය ජාතික අනන්‍යතාව රඳා පවතින්නේ කෙසේ ද?
(3) ශීඝ්‍රයෙන් වර්ධනය වන බෝ නොවන රෝගවලින් තරුණ පරපුර රැකගනිමු.
(4) ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව වන වොලිබෝල් (අත්පන්දු) ක්‍රීඩාව නැංවීමට ගත හැකි උපාය මාර්ග
(5) රජයන් වෙනස්වීමත් සමඟ වෙනස් නොවන අධ්‍යාපන ප්‍රතිපත්තියක් මත ඵලදායී ශ්‍රම බලකායක් බිහි කළ හැකිය. (ලකුණු 25)

(04) (අ) පහත සඳහන් වාක්‍යවල **සදොස් තැන්** ඇතොත් නිදොස් කොට ලියන්න.

(1) දයාබර ගුරු මාතාවක වූ ඈ දක්ෂ ගායිකාවක ද වූවා ය.

(2) ළමයි සියලු දෙනා අද දිනයේ දී පාසලට පැමිණ ඇත.

(3) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන්හි පෙන්වන කාටුන් චිත්‍රපට බලන ළමෝ කාලය කා දමයි.

(4) ළමයි දිනපතා අධ්‍යයන කටයුතුවල නිරතවීම මැනවි.

(5) ත්‍රස්තවාදීහු පහර දෙති'යි ජනතාව සැක පහළ කරති.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(1) පරිසර ලෝලීහු ගාංගාවන් දෙපස තුරු ලතාවන් රැක ගනිති.

(2) ආපදා අවස්ථාවන්හි දී ජාත්‍යන්තර ප්‍රජාව ශ්‍රී ලාංකේය ජනතාවට ආධාර උපකාර කළහ.

(3) ආරක්ෂක හමුදාවෝ ත්‍රස්තවාදීන් මර්දනය කරති.

(4) අලුතින් පාසලට පැමිණි පළමු වන ශ්‍රේණියේ දරුවන්ට විදුහල්පතිතුමා පංති භාර ගුරුතුමියක හඳුන්වා දුන්නේ ය.

(5) ඔලිම්පික් ක්‍රීඩා උළෙලෙහි දී ශ්‍රී ලාංකේය ක්‍රීඩකයෝ රිදී පදක්කම් රැසක් දිනාගත්හ.

(ඇ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තෝරා ලියන්න.

(1) දක්ෂතම (ක්‍රීඩිකාවක්/ ක්‍රීඩිකාවක) වන ඈ ප්‍රවීණ (ගුරුවරියක/ ගුරුවරියක්) ද වූවා ය.

(2) ගම් වැදුණු (අලි/ අලින්) පහර දෙතියි (මිනිස්සු/ මිනිසුන්) බියෙන් පසු වෙති.

(3) (ගුරුවරුන්/ ගුරුවරු) වනාහි අනාගත පරපුර රකින මිහිපිට (දෙවිවරු/ දෙවිවරුන්) වෙති.

(4) ඇතැම් (ළමයි/ ළමයින්) කාටුන් චිත්‍රපට නැරඹීමට වැඩි කැමැත්තක් (දක්වති/ දක්වයි)

(5) (නා හිමි/ නා හිමියෝ) වෙහෙර මළුව (අමදිති/ අමදියි) (ලකුණු 5 × 3 = 15යි.)

(05) පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංකය දක්වන්න.

(1) ලේන කුලේ සිට **ආ ගිය** මඟතොට සිටියා **නොසැලෙන** පහන් ටැඹක් **සේ**

(ආ ගිය - යුගල පද, නොසැලෙන - කෘදන්ත, සේ - නිපාත)

(2) **වරලස** අක් බමරුන් රැඳි රේඛා - **දෑසෙහි** නිලුපුල් මල් පෙති රේඛා

දෙතොලෙහි ආදර **හසරැලි** රේඛා - ඔබ රුව සිතෙනෙන් හද ඇඳි රේඛා

(වරලස - තද්ධිත, දෑසෙහි - සන්ධි, හසරැලි - රූපක)

(3) **පවුල් ජීවිතය** යනු **මව්පිය** දූදරු අඹුසැමි සම්බන්ධතාව **පමණක්** නොව ඒ වටා තවත් අංග කීපයක් ඒකරාශී වන ස්ථානයකි.

(පවුල් ජීවිතය - සමාස, මව්පිය - සමාස, පමණක් - නිපාත)

(4) **දරිද්‍රතාව** හා විදේශීය සංක්‍රමණය **නම්** ප්‍රපංච දෙක **අන්‍යෝන්‍ය** වශයෙන් සම්බන්ධතාවක් දක්වයි.

(දරිද්‍රතාව - තද්ධිත, නම් - නිපාත, අන්‍යෝන්‍ය - සන්ධි)

(5) **බුදුසමය** පිළිබඳව විවිධ **දෘෂ්ටිකෝණයන්ගෙන්** කෙරෙන අධ්‍යයන සමාලෝචන, ඇගයීම් සහ විචාර නිරතුරුව අප හමුවට පත්වෙයි.

(බුදුසමය - සමාස, දෘෂ්ටිකෝණයන්ගෙන් - විභක්ති, අධ්‍යයන - සන්ධි) (ලකුණු 5 × 3 = 15යි.)

(06) (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත්ම ගැළපෙන පදය වරහන තුළි දී ඇති පද අතුරෙන් ලියන්න.

(විෂය පථය, අල්පේච්ඡ, සංරක්ෂණ, ආධ්‍යාත්මික, පෘථුල, අභිලාෂයන්)

(1) පුද්ගලයා තම පුද්ගලික අභිමතය පරිදි තම ............................................ තෘප්තිමත් කරගැනීම සඳහා ක්‍රියාකිරීම මගින් සමාජයේ විධිමත් සංවිධාන ව්‍යුහය බිඳ වැටේ.

(2) සංවර්ධනය යනු හුදෙක් භෞතික දියුණුව ම පමණක් හෝ ............................................ දියුණුව ම පමණක් නොවන බවත් එය එකී උභයාංශයේ ම මුහුවක් බව කියවේ.

(3) ව්‍යවහාරික මනෝවිද්‍යාවේ උප විෂයක් වන සායනික මනෝවිද්‍යාව ගත් විට එහි ............................................ සීමා කිරීම පවා ඉතාමත් අපහසු ය.

(4) වර්තමානය වන විට රූපවාහිනී මාධ්‍යය ............................................ ලෙස ව්‍යාප්ත වෙමින් ක්ෂණිකව තොරතුරු හුවමාරු කරගැනීම තුළින්, ලෝකය විශ්ව ගම්මානයක් බවට පත්කිරීම සඳහා අගනා මෙහෙයක් ඉටු කර ඇත.

(5) බුදුසමය හා ආයුර්වේදය අතර පැනෙන සබඳතාව පිළිබඳව අවධානය යොමු කිරීමේ දී තෙවනුව ශාසන ඉතිහාසගත සෞඛ්‍ය ............................................ විධීන් ආයුර්වේදයේ මූලික සිද්ධාන්ත සමඟ ගැළපේ.

(6) පැරණි සමාජය වූ කලී ............................................ සමාජයකි.

(ලකුණු 1/2 × 6 = 03යි.)

(ආ) පහත දක්වා ඇති පද සන්ධිකර ලියන්න.

(1) අති + අවශ්‍ය (2) දෙ + අත

(3) ගුරු + උපදේශ (4) ඔවුන් + ඔවුන්

(5) කර්ණ + ඉන්ද්‍රිය (6) දෙ + අකාර

(ලකුණු 1/2 × 6 = 03යි.)

(ඇ) තදකළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(1) **මහණ,** එමඟට නොයා, **එමඟ** අඟුල්මල් සොරා කෑ දරුණු ලෙහෙ මුඩු අත් ඇත්තෙයැ.

(2) සිංහල භාෂා ප්‍රවීණත්වය පතන **විද්‍යාර්ථීන්ට** මේ **ග්‍රන්ථය** පරම ප්‍රතිෂ්ඨාධාර වන්නේ ය.

(3) ඈත එපිට **ගම්මානෙන්** නැඟ එන බට ලී හඬ අතරේ
ඉතා ම දුක්බර **කවියක්** මතුවෙ ද ඇය නිදි නොමැති පැලේ (ලකුණු 1/2 × 6 = 03යි.)

(ඈ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත වාක්‍ය නැවත ලියන්න.

(1) විදේශීය රාජ්‍ය නායකයා මෙරටට පැමිණියේ ය මහනුවර දළදා මාලිගාවට ගොස් දළදා සමිඳු වැඳ පුදා ගත්තේ ය පසු දින පෙරවරුයෙහි සිය රට බලා පිටත්ව ගියේය

(2) පසුගිය දා අවාසනාවන්ත සිද්ධීන් කිහිපයක් ඇති විය රට පුරා සාමාන්‍ය ජනතාව බියට පත්වූහ

(3) අ.පො.ස. උසස් පෙළ සිංහල විෂය හදාරණ සිසුන්ට ප්‍රේමතෝ ජායතී සෝකෝ නාට්‍යය නිර්දේශ කර ඇත.

(ලකුණු 1/2 × 6 = 03යි.)

(ඉ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(1) ''මං අද ඉස්කෝලේ ගියා'' පුතා පැවසුවේ ය.

(2) ''මතින් තොර තරුණ පරපුරක් බිහිකිරීමට උත්සාහ ගන්නවා'' යැයි රාජ්‍ය නායකයෝ කියති.

(3) ''ගුණ නැණ පිරි දරු පිරිසක් බිහි කරන්නැ''යි අධ්‍යාපන ඇමතිතුමා ගුරුවරුන්ගෙන් ඉල්ලයි.

(ලකුණු 1 × 3 = 03යි.)

(07) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අනුරූප පද සංයෝග නීතිය ක්‍රියාත්මක කළහොත් **ව්‍යතිමිශ්‍ර** සමාසවල උපප්‍රභේදයක් ලෙස සැලකිය යුතු විශේෂ ප්‍රයෝග සැහෙන ප්‍රමාණයක් ව්‍යවහාරයෙන් මැකී යයි. මේ උප ප්‍රභේදය නම් **නෛරුක්තික** ප්‍රවර්ග දෙකකින් ගත් එක ම අර්ථය සහිත ප්‍රකෘති යුගල සංඝටනය කිරීමෙන් සිද්ධ ප්‍රතිරාව සමාසයි. **ප්‍රතිරාව** සමාසයෙක ලක්ෂණය වනුයේ භාෂාවේ පවත්නා පුරාතන තද්භව ප්‍රකෘතියෙක අර්ථය වඩාත් පැහැදිලි ව **සන්නිවේදනය** කිරීම සඳහා ඒ අර්ථය ම ප්‍රතිරාව නංවන **තත්සම** ප්‍රකෘතියක් සමඟ මුලින් කී තද්භව ප්‍රකෘතිය **සංඝටනය** කිරීම යි. විළි ලජ්ජාව, පඬුරු පාක්කුඩම්, කෙළි සෙල්ලම්, ලයිට් එළිය ආදී නිදසුන් සමුදායයක් මේ සඳහා දැක්විය හැකි ය. මේ නිදසුන් අනුව පැහැදිලි වන්නේ විෂම නෛරුක්තික ප්‍රවර්ග දෙකකට අයත් **ප්‍රකෘති** දෙකක් අන්තර්ගතවීම ප්‍රතිරාව සමාසයෙක එක්තරා අනන්‍යතා ලක්ෂණයක් බව යි. එබැවින් ඊනියා අනුරූප සංයෝග නීතිය රකින්නකුට ප්‍රතිරාව සමාස ව්‍යවහාර කිරීමට අවකාශයක් නොලැබේ.

(1) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළට සකස් කර ලියන්න.

(2) නෛරුක්තික, සමුදාය, අනුරූප යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.

(3) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

(i) අනුස්වාරය සහ මහාප්‍රාණ අක්ෂරයක් යෙදුණු වචනයක්

(ii) තාලුජ අක්ෂරයක් සහ මූර්ධජ අක්ෂරයක් යෙදුණු වචනයක්

(iii) අන්තස්ථ අක්ෂරයක් සහ මූර්ධජ අක්ෂරයක් පමණක් යෙදුණු වචනය ලියන්න.

(4) පහත සඳහන් පදවල උපසර්ග පද වෙන් කර දක්වන්න.

විෂම, සන්නිවේදනය, ප්‍රතිරාව

(5) පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට උදාහරණ වචන බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න.

අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා, සමාප්ති වාචක නිපාත ක්‍රියා

(ලකුණු 3 × 5 = 15)

(8) පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(1) ස්වර සන්ධිය

(2) මිශ්‍ර ක්‍රියා පද

(3) අනියමාර්ථ නාම පද

(4) දකාරාර්ථ සමාසය

(5) ප්‍රයෝජ්‍ය ක්‍රියා පද (ලකුණු 5 × 3 = 15)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved **Answer**

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
**Southern Provincial Department of Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) 13 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි

**General Certificate of Education (Adv. Level), Grade 12, Year End Test, July 2019**

**සිංහල** | 71 | S | I | **පිළිතුරු පත්‍රය**

## I පත්‍රය

(01) (අ) (1) බුදුන් අදින්නපුබ්බකගේ නිවසට වැඩියේ බතක් (දානය) නිසා නොව අසරණව සිටි මට්ටකුණ්ඩලීට පිහිට වීම සඳහා ය.

(2) බුදුන් වහන්සේගේ ශරීරයෙන් බුදු රැස් විහිදා ඒ රැස් බිත්තියේ වැදීමෙන්

(3) තිස් දෙකක් වූ මහා පුරුෂ ලක්‍ෂණයෙන් හා බුද්ධ ශරීරයෙහි ඇති අනෙකුත් අනුලක්‍ෂණයෙන් හා කේතුවක ආකාරයෙන් බඹයක් තරම් උසට විහිදෙන රශ්මි මාලාවෙන්

(4) කෝටි සියදහස් ලක්‍ෂ ගණනින්

(ලකුණු 4යි)

(ආ) (1) සම්පත් භය ගෙනදෙන කාරණයක් බව, සම්පත් නිසා මරණය වුව ද සිදුවිය හැකි බව

(2) පළමුව උපාලි නම් කපුවා මහණ කොට රජදරුවන් ලවා වැන්දවීමෙන් රජදරුවන්ගේ මානය බිඳෙයි.

(3) අපගේ කුලයේ ශාකයෝ ඉතාමත් අහංකාරයි. ආඩම්බරයි.

(4) පහත් වචන ප්‍රකාශ කරමින් අපහාසයට පත් කරමින් බැනීම. (ලකුණු 4යි)

(ඇ) (1) චන්ද්‍රිකාවගේ උතුම් ගුණයක් වූ පතිවත රැකීම නිසාත්, ඇයට විපතක් වූ විට ඈ රැකි පතිවතේ බලයෙන්

(2) ශක්‍රයා පැන් භාජනයෙන් පැන් ඉසිනවාත් සමඟ ම ඊතලය වැදුණු තුවාලයේ විෂ නැති වී තුවාලය සුව වී තුවාලය තිබුණු තැනැක්වත් සොයාගත නොහැකි වන සේ සුව විය.

(3) සක්වළ දෙවියෝ ජීවත් වෙනවාද නැත්නම් මැරිලාදැයි, මාගේ දුක නොබලාවි දැයි දෙවියන්ට ඉතාමත් උස් හඬින් යාච්ඤා කරමින් හැඬූහ. (ලකුණු 4යි)

(4) සු - හතර

අසූ දාහස - අසූ දාහ

අසූ හතර දහසක්

(ඈ) (1) උද්දාල බමුණා සමග වාසය කිරීම.

(2) ඇස් කෙළවරින් බලා ස්ත්‍රී ලීලාවෙන් මදහස බැල්මෙන් රජු මුහුණ බලා පොරවා සිටි ඇතිරිල්ල ටිකක් ඉවත් කර ශරීර ප්‍රභාව දැක්වීමෙන්,

(3) මෙම කාන්තාව ස්වාමියෙක් සමඟ ජීවත් වනවා ද, ස්වාමියෙක් නැතුව ජීවත් වනවා ද?

(4) තූර්යභාණ්ඩ යනු වාදනය කරන භාණ්ඩයි.

(ලකුණු 4යි)

(ඉ) (1) ගිරවුන් හා මොනරුන්

(2) මොණරුන්, ඔවුන් අමනාප වූයේ ඔවුන්ගේ පිලෙහි ඇති ඇස් මහබඹු කන් බවට පත් නොකළ නිසා

(3) විශේෂයෙන්ම දස දෙසම පැතිරී යන වීණා නාදය අසමින් ගිරව් ගස් මුදුන්වල රැඳී සිටිති.

(4) කට උඩට හරවාගෙන ආශාවෙන්

(ලකුණු 4යි)

(ඊ) (1) දඹදෙණි යුගයේ මයුරපාද පරිවේණාධිපති බුද්ධ පුත්‍ර මාහිමියන් විසින් රචිත පූජාවලිය නම් ග්‍රන්ථයේ, ජීවක වෛද්‍යවරයාගේ කතා වස්තුවෙන් උපුටා ගැනුනකි. බිම්බිසාර රජුගේ පුත් අභය රාජකුමාරයාට දාව සාලවතී නම් ගණිකාවට පුතෙක් ලැබිණි. ඔවුන් වළ දැමීම සිරිතකි. එහි දී රජවරුන් ඇය කරා ගෙන්වා ගැනීමේ අරමුණින් එම දරුවා (ජීවක) පරණ කුඩ කබලක දමා ඊට උඩින් කසල දමා කුණු ගොඩකට ගිහින් දමන්න යැයි සාලවතී ගණිකාව සේවිකාවට කරන ලද ප්‍රකාශයකි.

(2) ගම්පළ යුගයේ දෙවන ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයේ ස්වර්ණතිලකා කතා වස්තුවෙන් උපුටා ගෙන ඇත. ස්වර්ණතිලකාවට වශී වූ උද්දාල බමුණා තක්සලාවට නොපැමිණීම නිසා කෝපයට පත් ශිෂ්‍යයෝ ස්වර්ණතිලකාව මැරවීමට විවිධ උපක්‍රම යොදා ඒවා අසාර්ථක වූ පසු මිනිස්සු යවා රාත්‍රී කාලයේ ඇයව මැර වූහ. එයින් දුකට පත් උද්දාල බමුණා තමාට ම මෙසේ කියා ගනිමින් රජ මිදුලෙහි දර සෑයක් බැඳ එම ගින්නට පැන මළේ ය.

(3) දඹදෙණි යුගයේ ධර්මසේන හිමියන් විසින් රචිත කුණ්ඩලකේසී කතා වස්තුවෙන් උපුටා ගෙන ඇත. කුණ්ඩලකේසී සොර ස්වාමියාගෙන් ගැලවී මරණයෙනුත් මිදී සැරියුත් හිමියන්ගෙන් බණ අසා රහත් වීම ගැන ධර්ම සභාවේ රැස් වී සිටි භික්ෂූන් වහන්සේලාට ඇති වූ සැකය නිසා කළ සාකච්ඡාවේ දී බුදුන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලාගේ සැකය දුරු කරන අදහසින් මෙසේ ප්‍රකාශ කරන ලදී.

(4) කුරුණෑගල යුගයේ බහු කර්තෘත්වයකින් රචිත පන්සිය පනස් ජාතක පොතෙ හි චුල්ලධනුද්දර ජාතකයෙන් උපුටා ගෙන ඇත. චුල්ලධනුද්දර කුමාරයා හා සොරා අතර සටනේ දී චුල්ලධනුද්දර කුමාරයාගේ බිරිඳ කඩුව සොරාට දීම නිසා (සොරා කෙරෙහි ආශාවෙන්) ධනුද්දර කුමාරයාට සොරා අතින් මිය යන්නට සිදු විය. සොරා ඇය සතු ආභරණ රැගෙන ගඟෙන් එතෙර යන මොහොතේ දී චුල්ලධනුද්දර කුමාරයාගේ බිරිඳ විසින් සොරාට මෙසේ ප්‍රකාශ කළාය.

(5) ඒ. ජී. ගුණරත්න විසින් සිංහලයට අනුවර්තනය කරන ලද බැද්දේගම නවකතාවේ සිළිඳු තම දුව වූ පුංචි මැණිකාට නිදහසේ ජීවත් වීමට ප්‍රනාන්දු හා ආරච්චිට වෙඩි තබා මරණ ලදී. මිනීමැරූ සිළිඳු කඹුරුපිටිය රටේ මහත්තයාට ප්‍රකාශ කර පසු ඔහු සිළිඳු සමඟ මහේස්ත්‍රාත් හමුවීමට ගොස් විස්තර කියූ සිළිඳු විසින් මහේස්ත්‍රාත්වරයාට මෙසේ ප්‍රකාශ කළේ ය.

(6) මහාචාර්ය එදිරිවීර මහතා විසින් රචිත පේමතෝ ජායතී සෝකෝ නාට්‍යයේ තුන්වන අංකයෙන් උපුටා ගන්නා ලද්දකි. ස්වර්ණතිලකාව කෙරෙහි වශී වුණ උද්දාල බමුණා තක්සලාවට නොපැමිණේ. අධ්‍යාපනය ලැබීමට නොහැකි වුණු දප්පුල විසින් අග්ගිදත්තට මෙසේ ප්‍රකාශ කරයි.

(7) මාර්ටින් වික්‍රමසිංහ සූරීන් විසින් රචිත වහල්ලු කෙටි කතා සංග්‍රහයේ වහල්ලු කෙටිකතාවෙන් උපුටා ගන්නා ලද්දකි. උපාලිස් තම කරත්තයේ හඳයා නැමැති ගොනා බැඳගෙන ගාල්ලට යන අවස්ථාවක කරත්තයෙන් ගාල්ලට නඩුවක් සඳහා යන මුදලාලි කෙනෙකුට උපාලිස් විසින් මෙසේ ප්‍රකාශ කරන ලදී.

(ලකුණු 4 × 4 = 16යි)

## II පත්‍රය

### I කොටස

| | | | |
|---|---|---|---|
| 01. (2) | 06. (3) | 11. (2) | 16. (3) |
| 02. (4) | 07. (5) | 12. (5) | 17. (5) |
| 03. (3) | 08. (2) | 13. (3) | 18. (2) |
| 04. (5) | 09. (4) | 14. (1) | 19. (1) |
| 05. (1) | 10. (1) | 15. (4) | 20. (3) |

(ලකුණු 20යි)

### II කොටස

(02) (අ) අවබෝධය

(i) භාෂාව භාවිත කරන ජනතාව වෙනස් වීමයි.

(ii) ජනතාවක් සතු අදහස් උදහස්, ඕනෑ එපාකම්, සිතුම් පැතුම්, දුක් දොම්නස්

(iii) පරම්පරාවෙන් පරම්පරාවට මිනිසුන්ගේ අදහස් උදහස්, සිතුම් පැතුම් ආදිය වෙනස් වන නිසයි.

(iv) අභ්‍යන්තර හා බාහිර වශයෙනි.

(v) සුබෝච්චාරණය, සරලකරණය, ප්‍රමාද දෝෂ යනාදියයි.

(vi) වෙනත් භාෂාවක බලපෑම, තාක්ෂණික අවශ්‍යතා, ජනමාධ්‍යයේ නැඟීම, වානිජ ලෝකයේ ව්‍යාප්තිය

(ලකුණු 2 × 6 = 12යි)

(ආ) සාරාංශය

(03) රචනාවට අදාළ පරිදි ලකුණු දෙන්න.

(04) (අ) (1) දයාබර ගුරුමාතාවක වූ ඈ දක්ෂ ගායිකාවක් ද වූවා ය.

(2) ළමයින් සියලු දෙනා අද දිනයේ දී පාසලට පැමිණ ඇත.

(3) ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන්හි පෙන්වන කාටූන් චිත්‍රපට බලන ළමෝ කාලය කා දමති.

(4) ළමයින් දිනපතා අධ්‍යයන කටයුතුවල නිරතවීම මැනවි.

(5) ත්‍රස්තවාදීහු පහර දෙතියි ජනතාව සැක පහළ කරති.

(ආ) (1) පරිසරලෝලීන් විසින් ගංගාවන් දෙපස තුරුලතාවෝ රැකගනු ලබත්/ රැකගැනෙත්/ රැකෙති.

(2) ආපදා අවස්ථාවන්හි දී ජාත්‍යන්තර ප්‍රජාව විසින් ශ්‍රී ලාංකේය ජනතාවට ආධාර උපකාර කෙරිණි/ කරන ලදී.

**Answer**

(3) ආරක්ෂක හමුදාවන් විසින් ත්‍රස්තවාදීහු මර්දනය කෙරෙති/ කරනු ලබති

(4) අලුතින් පාසලට පැමිණි පළමු වන ශ්‍රේණියේ දරුවන්ට විදුහල්පතිතුමා විසින් පංති භාර ගුරුතුමියක් හඳුන්වා දෙන ලද්දීය/ දෙනු ලැබුවා ය.

(5) ඔලිම්පික් ක්‍රීඩා උළෙලෙහි දී ශ්‍රී ලාංකේය ක්‍රීඩකයන් විසින් රිදී පදක්කම් රැසක් දිනා ගැනිණ/ දිනා ගන්නා ලදී.

(ඇ) (1) දක්ෂතම ක්‍රීඩිකාවක වන ඈ ප්‍රවීණ ගුරුවරියක් ද වූවා ය.

(2) ගම් වැදුණු අලින් පහර දෙති යි මිනිස්සු බියෙන් පසු වෙති.

(3) ගුරුවරු වනාහි අනාගත පරපුර රකින මිහිපිට දෙවිවරු වෙති.

(4) ඇතැම් ළමයි කාටුන් චිත්‍රපට නැරඹීමට වැඩි කැමැත්තක් දක්වති.

(5) නා හිමි වෙහෙර මළුව අමදියි. / නා හිමියෝ වෙහෙර මළුව අමදිති.

(ලකුණු 5 × 3 = 15යි)

(05) (1) ආ ගිය - යුගල පද/ විරුද්ධ පද එකතු වීමෙන්
නොසැලෙන - වර්තමාන කෘදන්ත
සේ - සමානාර්ථයේ නිපාත

(2) වරලස - අස් ප්‍රත්‍යය එක්වීමෙන් තද්ධිත
දෑසෙහි - ස්වරාදේශ සන්ධි
හසරැලි - රූපක

(3) පවුල් ජීවිතය - විශේෂණ සමාස
සමාස - දකාරාර්ථ සමාස
පමණක් - සීමාව දක්වෙන නිපාත

(4) දරිද්‍රතාව - බව කියවෙන තද්ධිත
නම් - වෙනස් කිරීමේ නිපාත
අන්‍යෝන්‍ය - ස්වරාදේශ සන්ධි

(5) බුදුසමය - විභක්ති සමාස
දෘෂ්ටිකෝණයන්ගෙන් - කරණ විභක්ති
අධ්‍යයන - සංස්කෘත සන්ධි

(ලකුණු 5 × 3 = 15යි)

(06) (අ) (1) අභිලාෂයන්
(2) ආධ්‍යාත්මික
(3) විෂය පථය
(4) පෘථුල
(5) සංරක්ෂණ
(6) අල්පේච්ඡ (ලකුණු 1/2 × 6 = 03යි)

(ආ) (1) අත්‍යවශ්‍ය (2) දෑත
(3) ගුරූපදේශ (4) ඔවුනොවුන්
(5) කර්මේන්ද්‍රිය (6) දෙයාකාර

(ලකුණු 1/2 × 6 = 03යි)

(ඇ) (1) මහණ - ආලපන
එමගැ - ආධාර

(2) විද්‍යාර්ථීන්ට - සම්ප්‍රදාන
ග්‍රන්ථය - ප්‍රථමා

(3) ගම්මානෙන් - අවධි
කවියක් - ප්‍රථමා (ලකුණු 1/2 × 6 = 03යි)

(ඈ) (1) විදේශීය රාජ්‍ය නායකයා මෙරටට පැමිණියේ ය. මහනුවර දළදා මාලිගාවට ගොස් දළදා සමිඳු වැඳ පුදා ගත්තෙ ය. පස දින පෙරවරුයෙහි සිය රට බලා පිටත්ව ගියේ ය.

(2) පසුගිය දා අවාසනාවන්ත සිද්ධීන් කිහිපයක් ඇති විය. රට පුරා සාමාන්‍ය ජනතාව බියට පත්වූහ.

(3) අ.පො.ස. උසස් පෙළ සිංහල විෂය හදාරණ සිසුන්ට "ප්‍රේමතෝ ජායතී සෝකෝ" නාට්‍යය නිර්දේශ කර ඇත. (ලකුණු 1/2 × 6 = 03යි)

(ඉ) (1) ඔහු අද ඉස්කෝලේ ගිය බව පුතා පැවසුවේය.

(2) මතින් තොර තරුණ පරපුරක් බිහිකිරීමට උත්සාහ ගන්නා බව රාජ්‍ය නායකයෝ කියති.

(3) ගුණ නැණ පිරි දරු පිරිසක් බිහි කරන ලෙස හිටපු අධ්‍යාපන ඇමතිතුමා ගුරුවරුන්ගෙන් ඉල්ලයි. (ලකුණු 1 × 3 = 03යි)

(07) (1) තත්සම, නෛරුක්තික, ප්‍රකෘති, ප්‍රතිරාව, ව්‍යතිමිශ්‍ර, සංඝටනය, සන්නිවේදනය

(2) කොම්බු දෙක, පාපිල්ල, ඉස්පිල්ල/ පාපිල්ල, ඇලපිල්ල, පාපිල්ල, දීර්ඝ පාපිල්ල

(3) (i) සංඝටනය
(ii) විශේෂ
(iii) විළි

(4) වි, සං/ සන්, ප්‍රති

(5) අසම්භාව්‍ය ක්‍රියා - කළහොත්
අවසාන ක්‍රියා - මැකී යයි/ දක්විය හැකි ය.
සමාප්ති වාචක නිපාත ක්‍රියා - කිරීම යි./ බව යි.

(ලකුණු 3 × 5 = 15යි)

(8) පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.
(හැඳින්වීම - ලකුණු 02/ විස්තරය හා උදාහරණ - ලකුණු 03)

(ලකුණු 3 × 5 = 15යි)


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440